# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 1865/26 – 2014 ජුනි 04 වැනි බදාදා – 2014.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2014 අංක 128 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/10/2013/UDA/699.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මහ/ඉ/අත්/යූඩීඒ/347.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 ජුනි මස 03 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, මහරගම.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාකුඹුර ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද CO/MHR/2014/158 හා 2014.03.31 දිනැති ප්‍රගමන අනුරේඛණයේ කැබලි අක්ෂර 'ඒ' වලින් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.3037 ක් පමණ වූ පහත නම් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම් :

01. **කැබලි අක්ෂර 'ඒ' – අකුරුතලවිට කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.3037 ක් පමණ**

උතුරට: ඇළ සහ අයිතිකරු සොයාගත නොහැකි අකුරුතලවිට කුඹුර; නැගෙනහිරට: අයිතිකරු සොයාගත නොහැකි අකුරුතලවිට කුඹුර; දකුණට: අයිතිකරු සොයාගත නොහැකි අකුරුතලවිට කුඹුර; බටහිරට: මා කුඹුර - හිරිපිටිය මාර්ගය සහ ඇළ.

06 – 537